# ප්‍රසන්න ජයකොඩිගේ '28' සිනමා කෘතියෙහි ස්ත්‍රීත්වය හා ලිංගිකත්වය නිරූපණයෙහි ලා උපයුක්ත සිනමාරූප භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

එච්. එම්. එස්. එස්. හේරත්
සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
sarasiherath7@gmail.com

**සාරසංක්ෂේපය**

සිනමාව යනු කලාවන් අතර ලාබාලතම කලාවයි. නමුත් මිනිසාගේ ආරම්භයේ සිට බිහි වූ සකලවිධ කලාවන් එහි ගැබ් ව ඇත. නවකතා කෙටිකතා ආදි කලාවන්ගේ විශිෂ්ටත්වයට ඒවායේ භාවිත බස උපකාරී වන්නේ කෙසේ ද? ඒ අයුරින් ම සිනමා කෘතියක විශිෂ්ටත්වය උදෙසා එහි භාවිත සිනමාරූප වැදගත් කාර්යයක් ඉටු කරයි. සිනමාව යනු රූපය භාෂා මාධ්‍යය වශයෙන් යොදාගත් ප්‍රබල කලාවකි. සිනමා නිර්මාණයක දී රූප භාවිතය හෙවත් රූප ගොඩනගන ආකාරය මත සිනමා කෘතියේ විෂය මූලික අර්ථය විශද කරයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ප්‍රසන්න ජයකොඩිගේ '28' නමැති සිනමා කෘතියෙහි ස්ත්‍රීත්වය හා ලිංගිකත්වය නිරූපණය කිරීම උදෙසා යොදාගත් සිනමාරූප භාවිතය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමයි. පර්යේෂණ ගැටලුව වූයේ ස්ත්‍රියගේ සංවේදනා සජීවී ව රූපණය කරන්නට සිනමාවේදියා යොදාගත් රූපමය භාවිතයන්හි උචිත අනුචිත බව කෙබඳු ද යන්න සොයා බැලීමයි. මෙහි ප්‍රධාන භූමිකාව හොබවන සුද්දීගේ චරිතය තරුණියක්, බිරිඳක් හා සේවයේ නිරත ස්ත්‍රියක් වශයෙන් සිනමා තිරය මත දිගහැරේ. ඒ ඔස්සේ ස්ත්‍රීත්වය හා ලිංගිකත්වය හා බැඳුණු කරුණු මෙන් ම සංස්කෘතික රාමුව තුළ සිර ව සිටින ස්ත්‍රියගේ නොහැකියාවන් විදාරණය කරන්නට සිනමාවේදියා භාවිත කළ රූපමය සංසිද්ධි සුවිශිෂ්ට ය. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ කරුණු එක් රැස් කරගත් අතර එහි දී ප්‍රසන්න ජයකොඩිගේ '28' සිනමා කෘතිය ප්‍රධාන මූලාශ්‍රය ලෙස යොදා ගනිමින් පූර්වෝක්ත විෂය හා සම්බන්ධ විචාර කෘති, අන්තර්ජාලය, සඟරා ලිපි ලේඛන ආදිය ද්විතීයික මූලාශ්‍රය ලෙස යොදා ගනු ලැබුණි. සාර්ථක රූප භාවිතයක් මගින් සමාජය තුළ දුර්වල තැනක ස්ථානගත කර ඇති ස්ත්‍රී භූමිකාව හා ලිංගිකත්වය නිසා ස්ත්‍රිය පීඩාවට පත් වන අවස්ථා මනාව නිරූපණය කරන්නට සිනමාවේදියා සමත් ව ඇති බව පර්යේෂණය අවසානයේ එළඹිය හැකි නිගමනයයි.

**ප්‍රමුඛ පද :** ලිංගිකත්වය, ස්ත්‍රීත්වය, සිනමා කෘතිය, සිනමා රූප

# A Study on the Use of Cinematography in the Portrayal of Femininity and Sexuality in Prasanna Jayakodi's Movie' 28'

H.M.S.S. Herath
Department of Sinhala, University of Kelaniya
Sarasiherath7@gmail.com

**Abstract**

Cinema is the youngest of the arts. But all kinds of arts born from the beginning of man are embedded in it. How does the use of language contribute to the excellence of the arts, such as novels and short stories? In the same way, for the excellence of a work of thought, its use of cinematography plays an important role. Cinema is a powerful art that uses images as a medium of language. The basic meaning of the subject of the film is based on the use of images or the way images are constructed in a film. The purpose of this research is to conduct a study on the use of cinematography used to portray femininity and sexuality in Prasanna Jayakodi's movie '28'. The research problem was to find out the appropriateness of the imagery used by the cinematographer to vividly depict women's feelings. The character of Suddi, who plays the main role here, unfolds on the screen as a young woman, a wife and a working woman. In this way, the pictorial phenomena used by the filmmaker to reveal the issues related to femininity and sexuality as well as the inabilities of women trapped in the cultural framework, are excellent. For this study, a qualitative research method was used to collect data in which Prasanna Jayakodi's movie '28' was used as the main source and critical works related to the previous subject, internet, and magazine papers were used as secondary sources. The conclusion that can be reached at the end of the research is that the cinematographer has been able to portray well the situations where women are oppressed due to sex and the role of women in a weak position in the society through the use of successful images.

**Keywords -** Cinematic images, Cinematography, Femininity, Sexuality